


# මරේගේ වාරය හා මියර්ස් ගේ කඳුළු

"මියර්ස් ගේ චියර්ස්" යයි කීම අනුප්‍රාසයට හොඳ වුවත් මට හිතට හරි නැත.

බ්‍රිතාන්‍ය ටෙනිස් ක්‍රීඩක ඇන්ඩි මරේ විවෘත එක්සත් ජනපද ටෙනිස් ශූරතාව දිනා ගන්නා සැටි මා බලා සිටියේ දැඩි සතුටකිනි. ඊට වඩා සතුටක් සිය ප්‍රථම මහා ශූරතාව වශයෙන් සුප්‍රකට ඔලිම්පික් කුසලාන දිනූ සැටි අගය කළෙමි.

එසේ කරන්නට හේතු ගණනාවක් ඇත . කොයි ආකාරයකින් හරි ඇන්ඩි මරේ අපේ ගමක ඉලන්දාරියකු සතු අහිංසක ගතිය පෙන්නුම් කරන





සුලු තරුණයකු ලෙසින්ය මා දකින්නේ. මේ නිසා මා තුළ ඔහු කෙරෙහි විශේෂ ලෙන්ගතු බවක් පිරී පවතී.

දෙවැනි කරුණ ඊට වඩා වැදගත් විය හැකි ය. අපේ කුඩා දිවයිනේ එදා පාලකයෝ අපේ මිනිසුන් හීලෑ කරගෙන තමන්ගේ අඩි පාරේ යාමට සුදුසු ශිෂ්ට සම්පන්න ජනතාවක් බවට පරිවර්තනය කිරීමට මං කිහිපයක් යොදා ගත්හ. එකක් රාජ්‍යයේ බලපෑමය. අනෙක ආගමය. එහි බලපෑම අඩු වැඩි වශයෙන් දක්නට ඇත . ක්‍රීඩාව තවත් පැත්තකි. සුදු මහත්වරුන් වාගේ ටෙනිස් ගහන්නටත් ක්‍රිකට් ගහන්නටත් අපේ දරුවන් හැඩ ගැසීමද සිදුවිය. ටෙනිස් කොහොම වෙතත් ක්‍රිකට් අතින් ඉහළටම යෑමට අපේ උදවිය සමත් වූහ.

අපට පමණක් නොව මුළු ලොවටම ටෙනිස් ක්‍රීඩාව පුරුදු කළේ බ්‍රිතාන්‍යයන් යයි සිතමි. එහෙව් එකේ සමස්ත ලෝකයේම අග්‍රගන්‍ය ක්‍රීඩා උළෙල වන ඔලිම්පික් උළෙලේ ටෙනිස් ශූරතාව බ්‍රිතාන්‍ය ජාතිකයකු විසින් බොහෝ කාලයකට පසුව අත්පත් කර ගැනීම අර්ථවත් ය.

ඇනා මියර්ස් බොහෝ වාරයක් සිය දේශය නියෙ-ජනය කළ ඕස්ට්‍රේලියානු බයිසිකල් ශූරියකි. ඇගේ දෙනෙතින් කඳුළු කඩා හැළුනේ අවසන් වරට ඔලිම්පික් රන් පදක්කම දිනා ගත් වේලාවේ ය. ඒ සතුට හා දුකට යන දෙකටම හෙළන ලද කඳුළු ලෙසින්ය මා දුටුවේ. සතුට තමා විසින් අත්පත්කරගන්නා ලද ජයග්‍රහණය නිසා ය. දුක සිය රට වෙනුවෙන් දස්කම් පෑම අවසන් වීම ගැන ය.

ක්‍රීඩාව ගැන මගේ දැනුම අල්ප ය. එහෙත් මම ශ්‍රී ලාංකික වාගේම ඕස්ට්‍රේලියානු ක්‍රිඩක ක්‍රීඩිකාවන් පානා දස්කම් බලා උද්දාමයට පත් වන්නෙමි. 2000 සිඩ්නි ඔලිම්පික් උළෙලේ දී සුසන්තිකා ජයසිංහ දුවන හැටි මා බලා සිටියේ අසීමිත අපේක්ෂා සහිතවය. තඹ පාට වුවත් ඇය ලැබූ පදක්කම ගැන මම සතුටු වුණෙමි. එය පසුව රිදී වූ බව ද ඇසීමි.

සිඩ්නි තරගයෙන් පසු ඇය කළ ප්‍රකාශය මට මතක ය. කෙසේ හෝ රන් පදක්කමක් දිනන බව ඇය ප්‍රකාශ කළා ය. එය ඉටු වූයේ නැත .

මේ තරම් කලක් ඔලිම්පික් තරගවලට සහභාගි වූ රටකින් වාර්තාවට ඇතුල්ව ඇත්තේ නම් දෙකක් පමණි. ඩන්කන් වයිට් හා සුසන්තිකා ජයසිංහ.

ඔලිම්පික් තරගවලට සහභාගි වන නිලධාරි හා ක්‍රීඩක සංඛ්‍යාව නම් අඩු වී නැත . අවුරුදු හතරකට පසු එන චාරිත්‍රානුගත විදේශ සංචාරයක තැනට මෙය පත්ව ඇත්ද?

මෙදා ලද සුළු පසුබෑම පරදා ඉදිරියට යාමට ඕස්ට්‍රේලියාව සමත් වන බව කීවත් ශ්‍රී ලංකාව ගැන එබඳු ප්‍රකාශයක් කළ නොහැකි ය. ඒ ඇයි?

මට එක් නිදසුනක් මතක් වෙයි. එය ක්‍රීඩාවට කෙළින්ම අදාළ නැත. පසුගිය වතාවක සබරගමු පළාත් සභා ඡන්දයට ඉදිරිපත් වූවන් අතර සුප්‍රකට ශ්‍රී ලාංකික ක්‍රීඩිකා සුසන්තිකා ජයසිංහ ද වූවා ය. අවසන ඇය පැරදී ලිස්සලා වැටුණේ රට තියා පළාත වුවත් හරියට නොහඳුනන බලවතුන් උඩට තල්ලු වෙද්දී ය.

මහා බලවතකු ඉදිරිපත්ව සුසන්තිකා ට ලැබුණු ඡන්ද අර බලවත් තරුණයාට පුද කළ බව කීවේ පළාතේම ප්‍රබලයෙකි. මම එය බොරු යයි නොසිතමි. හුදෙක් විය හැකි මැතිවරණ සෙල්ලමක් බව විශ්වාස කරමි.

සනත් ජයසූරිය පහසුවෙන් පාර්ලිමේන්තු අසුනක් දිනා ගත්තේ ය. සුසන්තිකාට පළාත් සභා ආසනය අහිමි විය. තත්වය මා දකින්නේ ඔය විදියට ය.
ළමයින් කන රටේ කුකුලන් ඇති කරන්නට බැරි යයි කතාවක් අපේ ගම් වල ඇත. ක්‍රිඩකයන් දේශපාලකයන්ගේ ගොදුරු බවට පත්වන රටක ජාත්‍යන්තර තලයේ සමත්කම් පානා ක්‍රීඩක පරපුරක් බිහිවීම පැතිය හැකි පෙළහරක් ද?

මරේගේ වාරය හා මියර්ස් ගේ කඳුළු ඔස්සේ මා දකින යතාර්ථය එයයි.

MASTER TUTORING ACADEMY
MTA
"Your success is our satisfaction"
Master Tutoring Academy

මාස්ටර් ටියුටරින්
පැයකට ඩොලර් 10
බජට් පැකේජය සමග
Dandenong වලට
පිවිසෙන වගයි !!!

සංවිධානය
නිහාල් කොඩිකාර

වැඩි විස්තර
0425 403 105
0430 635 335

3 4 5 පන්ති සඳහා

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements

We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)